# ආර්ථික විද්‍යාව 12

සති පාසල - 3 වන සතිය

1-3 නිෂ්පාදන සාධක වල ලක්‍ෂණ හදුනා ගනමින් නිෂ්පාදන සම්පත් වල ඵලදායිතාව තිරණය කරන සාධක විග්‍රහ කරයි.

නිෂ්පාදන සාධක :-

නිෂාපදන බිහි කර ගැනිම සදහා යොදා ගනු ලබන සාධකයි, එනම්

- ❖ භූමිය
- ❖ ශ්‍රමය
- ❖ ප්‍රාග්ධනය
- ❖ ව්‍යවසායකත්වය

නිෂ්පාදන සාධක

දේපළ සම්පත් → හමිය, ප්‍රග්ධනය

මානව සම්පත් → ශ්‍රමය, ව්‍යවසායකත්වය

භූමිය :-

ස්වභාවධර්මය දායාද කොට ඇති ඵලදායිතාවෙන් යුක්තව නිෂ්පාදනයට යොදවා ගත හැකි ස්වාභාවික සම්පත් භූමිය ලෙස හැදින්වේ වනාන්තර, ඛණිජ සම්පත්, සාගර, ඇළ දොළ,වන සතුන්,ගංගා හා වායුගෝලය වැනි පොළොව මතුපිට මෙන්ම අභ්‍යන්තරයේ ඇති සියලුම සම්පත් භූමියට අයත් වේ.

භූමියේ ලක්‍ෂණ :-

- ❖ ස්වභාවධර්මයේ දායාදයක් වීම.
- ❖ සැපයුම අනම්‍ය වීම.
- ❖ සංචලතාවයෙන් යුක්ත නොවීම.
- ❖ ඵලදායිතාව වර්ධනය කල හැකි වීම.
- ❖ ඒකාකාරි නොවීම.
- ❖ භූමියට කරන ගෙවීම බදුකුලිය වීම.

ප්‍රශ්න :-

1. නිෂ්පාදන සාධක නම් කරන්න.
2. " භූමිය" හදුන්වන්න.
3. භූමියෙහි ලක්‍ෂණ 5 ක් ලියන්න.

සැකසුම - A.C.P.D. අමරසිංහ

ර/කිරිඇල්ල ම.ම.වි.